ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2061/21 - 2018 මාර්තු මස 06 වැනි අඟහරුවාදා - 2018.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

සී.එෆ් 1/64

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති

2018 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

1A - G 22804 — 417 (2018/03)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නියෝග

ලුහුඬු නාමය

1. මේ නියෝග 2018 අංක .... දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග නමින් හඳුන්වනු ලැබේ.

I වන කොටස

සාමාන්‍ය

අර්ථ නිරූපණය

2. (1)යම් හදිසි අවස්ථා නියෝගයක වෙනත් අර්ථ නිරූපණයක් ප්‍රකාශිතව ම එහි සඳහන් කොට ඇත්තේ නම් මිස හෝ අන් ආකාරයක විධිවිධාන එහි ප්‍රකාශිතව ම සලස්වා ඇත්තේ නම් මිස හෝ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

"නීතිපතිවරයා" යන්න, යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් වන විට සොලිසිටර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්, අතිරේක සොලිසිටර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සහ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ, රජයේ නීතිඥ හෝ ඒ නියෝගයෙහි කාර්යය සඳහා ඒ වෙනුවෙන් නීතිපතිවරයා විසින් බලය පවරනු ලැබූ රජයේ යම් නීතිඥවරයෙක් ද ඊට ඇතුළත් වේ ;

"නිසි බලධරයා" යන්න, යම් හදිසි අවස්ථා නියෝගයක් වන විට ඒ නියෝගයේ අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ඒ නියෝගයේ කාර්යය සඳහා නිසි බලධරයකු වශයෙන් ජනාධිපතිවරයා විසින් නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ ;

"හදිසි අවස්ථානියෝගය" යන්නෙන්, මේ නියෝග අතුරින් යම් නියෝගයක් හෝ මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ වෙනත් යම් නියෝගයක් අදහස් වේ ;

"අත්‍යවශ්‍ය සේවය" යන්නෙන්, මහජන උපයෝගීතාවය හෝ ජාතික ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය ආරක්ෂා කිරීමට හෝ ජන ජීවිතයට අත්‍යවශ්‍ය සේවාවක් අදහස් වන අතර ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක් ඊට ඇතුළත් වේ ;

"පොලිස්පතිවරයා" යන්නට, යම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු සහ නියෝජ්‍ය පොලිස්පතිවරයකු ඇතුළත් වේ ;

"ඉඩම" යන්නට, ජලයෙන් වැසුණු ඉඩම් ද ගෙවල්වල හෝ ගොඩනැගිලිවල කොටස් ද ඇතුළත් වේ ;

"පොලිස් නිලධරයා" යන්නෙන්, පොලිස් ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පොලිස් හමුදාවක සාමාජිකයකු අදහස් වේ ;

"මහජන නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති අර්ථයම ඇත ;

"ශ්‍රී ලංකාව" යන්නට, එහි දේශීය ජලතීරය සහ දේශීය ගුවන් අවකාශය ඇතුළත් වේ ;

(2) අර්ථ නිරූපණ ආඥාපනත, යම් පනතක හෝ ආඥාපනතක හෝ ජාතික රාජ්‍ය සභාවේ පනතක හෝ අර්ථ නිරූපණය සඳහා අදාළ වන පරිද්දෙන් ම, හදිසි නියෝගයක හා එය යටතේ පනවනු ලබන කවර හෝ ආඥාවල හෝ රීතිවල අර්ථ නිරූපණය සඳහා ද අදාළ විය යුතු ය.

(3) යම් හදිසි අවස්ථා නියෝගයක් පිළිබඳව යම් ලේඛනයක හෝ වෙනයම් ලිඛිත නීතියක ඇති යම් සඳහන් කිරීමක් ම, ඉන් වෙනත් දෙයක් අදහස් කර ඇති බව නොපෙනෙන විට, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ යම් තදනන්තර නියෝගයකින් සංශෝධනය කර ඇති පරිදි ඒ නියෝගය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස තේරුම් ගත යුතු ය.

(4) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ යම් විධානයක හෝ ආඥාවක කාලසීමාවක් සඳහන් කළ යුතු බව ඒ නියෝගයෙන් නියම කර ඇති අවස්ථාවක හෝ එසේ සඳහන් කිරීමට එම නියෝගයෙන් ඉඩ සලස්වා ඇති

අවස්ථාවක සහ එවැනි යම් කාලසීමාවක් ඒ විධානයෙහි හෝ අඥාවෙහි සඳහන් නොවන අවස්ථාවක ඒ කාලසීමාව එම විධානය හෝ අඥාව කරනු ලැබුවේ යම් නියෝගයක් යටතේ ද ඒ නියෝගය බලපවත්නා කාලසීමාව වශයෙන් සැලකිය යුතු ය.

3. අන්‍යාකාරව ප්‍රකාශිත විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් පවරනු ලැබූ බලතල, ජනාධිපතිවරයා වෙත හෝ වෙනත් යම් අධිකාරයක් හෝ තැනැත්තකු වෙත නීතියෙන් සතු වී හෝ පැවරී තිබෙන වෙනත් යම් අයිතිවාසිකම් හෝ බලතලවලට අමතරව වන අතර ඒ අයිතිවාසිකම් හෝ බලතලවල බලය හීන කිරීමක් වශයෙන් නොවන්නේ ය.

හදිසි අවස්ථා බලතල වෙනත් බලතලවලට අමතරව බව

4. යම් හදිසි අවස්ථා නියෝගයකින් ජනාධිපතිවරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ජනාධිපතිවරයා විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් අමාත්‍යවරයකු විසින් ක්‍රියාවේ යෙදවීම, කිරීම හෝ ඉටු කිරීම හෝ කළ හැකි ය.

ජනාධිපතිවරයාගේ බලතල යම් අමාත්‍යවරයකු වෙත පැවරීම

5. (1)ජනාධිපතිවරයා විසින් යම් හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා යම් තැනැත්තකු නාමයෙන් හෝ ධුරයෙන් නිසි බලධරයා වශයෙන් සාමාන්‍යයෙන් මුළු ශ්‍රී ලංකාව සඳහා හෝ ඒ තැනැත්තා පත් කරනු ලබන ලියවිල්ලෙහි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා හෝ පත් කරනු ලැබිය හැකි අතර එම ලියවිල්ලෙහි නිශ්චිතව සඳහන් කාර්යය සඳහා සීමා කරනු ලැබිය හැකි ය.එසේ වුව ද, යම් නියෝගයක යම් කාර්යයක් සඳහා හෝ යම් නිශ්චිතව සඳහන් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා හෝ නිසි බලධරයන් වශයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කිරීම මේ ඡේදයේ පෙරාතුව වූ විධිවිධානවල කිසිවකින් වැළැක්වේ යයි නොසැලකිය යුතු ය.

නිසි බලධරයා පත් කිරීම

(2) යම් ධුරයක් දරන්නකු ඒ ධුර නාමයෙන් නිසිබලධරයකු ලෙස පත් කරනු ලැබ ඇති අවස්ථාවක පටහැනි විධානයක් ප්‍රකාශිතවම සලස්වා නොමැති නම්, එසේ නම් කරනු ලැබූ ධුරයෙහි කාර්යය එවකට ඉටු කරන තැනැත්තා ඒ පත් කිරීමට ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය.

6. යම් හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා යම් තැනැත්තකු වෙත භාර දිය යුතු දැන්වීමක්, ඒ හදිසි අවස්ථා නියෝගයේ අඩංගු යම් විශේෂ විධිවිධානවලට හානියක් නොමැතිව, ඒ තැනැත්තාගේ අතින්ම හෝ සිරිත් පරිදි වූ වාසස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානය වෙත ලියුමක මාර්ගයෙන් තැපෑලෙන් යැවීමෙන් භාර දිය හැකි ය.

දැන්වීම් භාරදීම

7. යම් ආඥාවක් හෝ රීතියක් සෑදීම සඳහා යම් හදිසි අවස්ථා නියෝගයකින් පැවරූ යම් බලයක් තේරුම් ගැනීමේ දී ඒ සඳහා බලය ක්‍රියාවේ යෙදූ ආකාරයටම හා එය යටත්වන යම් කොන්දේසි වෙතොත් ඒ කොන්දේසිවලටම යටත්ව, ඒ ආඥාව හෝ රීතිය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම සඳහා ද ක්‍රියාවේ යෙදිය හැකි බලයක් ඊට ඇතුළත් වූ ලෙස තේරුම් ගත යුතු ය.

ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම

II වන කොටස

අත්‍යවශ්‍ය සේවා

8. (1)ජනාධිපතිවරයා විසින් නාමයෙන් හෝ ධුරයෙන් මුළු ශ්‍රී ලංකාව සඳහා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විය යුතු යම් තැනැත්තකු ආඥාවක් මගින් පත් කරනු ලැබිය හැකි ය. අත්‍යවශ්‍ය සේවා සැපයීම හා පවත්වා ගැනීම හා සම්බන්ධ සියලු ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය.

අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පත් කිරීම

(2) අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ නියෝග යටතේ ඔහුගේ කාර්යන් සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි එවන් අතිරේක හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයන් හෝ සහකාර කොමසාරිස්වරයන් පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ නියෝග මගින් හෝ මේ නියෝග යටතේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති බලතල හෝ නියමකොට ඇති කාර්යය හෝ භාරකොට ඇති කර්තව්‍ය හෝ කිසිවක්, (2) වන ඡේදය යටතේ පත්කරනු ලැබූ යම් අතිරේක හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු වෙත, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් පවරනු ලැබිය හැකි ය.

(4) පහත දැක්වෙන යම් බලයක්, එනම් මේ නියෝග යටතේ යම් බලධරයකු හෝ නිලධරයකු වෙත පවරනු ලැබූ යම් බලයක්, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ නියෝග යටතේ වූ කාර්යය ඉටු කිරීම සඳහා ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි ය.

(5) අත්‍යවශ්‍යසේවා පවත්වාගෙන යන බවට නිසැකවම වග බලා ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන -

(අ) මේ නියෝග යටතේ යම් බලයක් පවරනු ලැබූ යම් බලධරයකුට හෝ නිලධරයකුට,

(ආ) මේ නියෝග යටතේ පත් කරනු ලැබූ යම් සම්බන්ධතා නිලධරයකුට,අත්‍යවශ්‍යසේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙනු ලැබිය හැකි අතර, එසේ දෙනු ලබන සෑම විධානයක්ම පිළිපැදීම අවස්ථාවෝචිත පරිදි නියම බලධරයාගේ, නිලධරයාගේ හෝ සම්බන්ධතා නිලධරයාගේ කාර්යය විය යුතු ය.

අත්‍යවශ්‍යසේවා

9. (1) යම් සේවාවක් අත්‍යවශ්‍ය සේවාවක් බවට ප්‍රකාශයට පත් කිරීම, මහජන සාමය පවත්වාගෙන යාම සහ සුරක්ෂිත කිරීම සඳහා සහ ජන ජීවිතය සඳහා අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය බව පෙනී යන්නේ නම්,ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, ජනාධිපතිවරයා විසින් එකී සේවාව අත්‍යවශ්‍ය සේවාවක් බවට ප්‍රකාශයට පත් කළ හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින් (1) වන ඡේදයට අනුකූලව අත්‍යවශ්‍ය සේවයක් බවට ප්‍රකාශයට පත් කරන ලද සේවයක් හා සම්බන්ධ යම් වැඩක යෙදී සිටින හෝ නියුක්ත කරනු ලැබ සිටින යම් තැනැත්තකු විසින් -

(අ) ඒ නියමයේ දින සිට එක් දිනයක් ඉකුත් වීමෙන් පසු ඔහුගේ වැඩ කරන නැතහොත් සේවයේ නියුක්ත ස්ථානයට හෝ ඔහුගේ සේවායෝජකයා නැතහොත් ඔහුගේ සේවායෝජකයාගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් කලින් කලට නම් කරනු ලැබිය හැකි වෙනත් යම් ස්ථානයකට පැමිණ සිටීමට නීත්‍යානුකූල හේතුවක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ ඒ සේවයේ ඔහුගේ සේවා නියුක්ති නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව නියමිත පරිදි වැඩ කිරීම නීත්‍යානුකූල හේතුවක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ සාමාන්‍ය වැඩ කරන දිනයක සම්පූර්ණ වැඩ කරන කාලසීමාව හෝ ඉන් යම් කොටසක් තුළ වැඩ නොකර එසේ වැඩ කිරීම පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ වැඩ කිරීමෙන් බැහැරව සිටියහොත්; හෝ

(ආ) ඒ නියමයේ දින සිට එක් දිනක් ඉකුත් වීමෙන් පසුව ඔහුගේ සේවායෝජක විසින් හෝ ඔහුගේ සේවායෝජකගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් විධාන කරනු ලැබිය හැකි පරිදි යම් වැඩක් කිරීම, නීත්‍යානුකූල හේතුවක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ;හෝ

(ඇ) නිශ්චිත සේවයක යොදවනු ලැබූ හෝ සේවයේ නියුක්ත කරනු ලැබූ තැනැත්තකුව සිටියදී ඔහුගේ සේවායෝජක හෝ සේවායෝජකගේ බලය යටතේ ක්‍රියාකරන තැනැත්තකු විසින් වරින් වර විධාන කරනු ලැබිය හැකි පරිදි ඒ වැඩ, ඒ සේවායෝජක හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියාකරන තැනැත්තා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි වේලාවක හෝ ස්ථානයක දී හෝ යම් කාලසීමා ඇතුළත ඉටු කිරීම (ඒ වෙලාව හෝ ස්ථානය හෝ කාලසීමාව සාමාන්‍ය වැඩ කරන වේලාව ඇතුළත හෝ ඉන් පිටස්තරව වුව ද නිවාඩු දිනවලදී වුව ද) පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්, ඔහු එසේ පැමිණ සිටීම හෝ වැඩ කිරීම පැහැර හැර හෝ ප්‍රතික්ෂේප කර ඇත්තේ වැඩ වර්ජනයක් හෝ වෙනත් සංවිධානාත්මක ක්‍රියාමාර්ගයක් නිසා වුව ද එය නොතකා ඒ තැනැත්තා -

(i) වෙනත් යම් නීතියක හෝ ඔහුගේ සේවා නියුක්තිය පාලනය වන යම් ගිවිසුමක නියමයන් හා කොන්දේසි කුමක් සඳහන් ව තිබුණ ද, ඒ වහාම ඔහුගේ සේවා නියුක්තිය කෙළවර කළ ලෙස හෝ අත්හැරිය ලෙස සියලු කාර්යය සඳහා සැලකිය යුතු ය ; තවද

(ii) ඊට අමතරව ඔහු වරදකට වරදකරු විය යුතු ය.

මේ ඡේදයෙහි "නිශ්චිත සේවය" යන්නෙන්, යම් සේවයක් හා සම්බන්ධව යම් වැඩක නියුක්ත කළහෝ යොදවනු ලැබූ යම් තැනැත්තකුට, වැඩ කරන සාමාන්‍ය වේලාවෙන් බාහිරව හෝ නිවාඩු දිනවල හෝ වැඩ කරන ලෙස නියම කරනු ලැබිය හැකි අත්‍යවශ්‍ය සේවයන් වන (1) වන ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් "නිශ්චිත සේවයක්" බවට ප්‍රකාශයට පත් කළ කවර හෝ අත්‍යවශ්‍ය සේවයක් අදහස් වේ.

(3) යම් සේවයක් අත්‍යාවශ්‍යසේවයක් බවට ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක -

(අ) කවර වූ හෝ ආකාරයකින් -

(i) ඒ සේවය පවත්වාගෙන යාමට අවහිර කරන බාධා කරන, ප්‍රමාද කරන හෝ සීමා කරන;

(ii) ඒ සේවයේ නියුක්ත ව සිටින වෙනත් යම් තැනැත්තන්ට අවහිර කරන, බාධා කරන හෝ වළක්වාලනු ලබන හෝ එම සේවය ඉටු කිරීම සම්බන්ධයෙන් ස්වකීය සේවා ස්ථානයට පැමිණීමෙන් වළක්වාලනු ලබන ;

(iii) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ සම්බන්ධව සේවයේ නියුක්ත කර සිටින වෙනත් යම් තැනැත්තකු ඔහුගේ සේවා ස්ථානයට පැමිණීමෙන් වැළැක්වීමට පොළඹවන, කැමති කරවා ගන්නා, හෝ දිරිමත් කරන;

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ දෙපාර්තමේන්තුවක ශාඛාවකින් වන සේවය වෙනුවට හෝ ඊට සමාන්තරව වෙනත් යම් සේවයක් පිහිටුවීමට හෝ පවත්වාගෙන යාමට බලකරන, පොළඹවන, කැමති කරවා ගන්නා හෝ දිරිමත් කරන ;

(v) ඒ සේවයේ පවත්වාගෙන යාම සඳහා හෝ ඒ හා සම්බන්ධව සේවයේ නියුක්ත කර සිටින වෙනත් යම් තැනැත්තකුට (ඒ වෙනත් තැනැත්තා එසේ සේවා නියුක්තිය අත්හැරීම හෝ ඉන් ඉවත්ව යාම කරනු ලැබුව ද නොලැබුව ද) ඔහුගේ සේවා නියුක්තිය අත්හැරීමට හෝ ඒ සේවා නියුක්තියෙන් ඉවත්ව යාමට බල කරන, පොළඹවන, කැමතිකරවාගන්නා හෝ දිරිමත් කරන; හෝ

(vi) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ හා සම්බන්ධ වෙනත් යම් තැනැත්තකු විසින් සේවා නියුක්තිය සැපයීම හෝ භාරගැනීම වළක්වන,

යම් තැනැත්තකු ; හෝ(ආ)යම් භෞතික ක්‍රියාවක් මගින් හෝ යම් කතාවක් හෝ ලේඛනයක් මගින් මේ ඡේදයේ (අ) උපඡේදය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති ක්‍රියාවක් කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු (ඒ වෙනත් තැනැත්තා එසේ නිශ්චිතව සඳහන් කර ඇති යම් ක්‍රියාවක් ප්‍රතිඵල වශයෙන් කරනු ලැබුව ද නොලැබුව ද) පොළඹවන, කැමති කරවාගන්නා හෝ දිරිමත් කරන යම් තැනැත්තකු,වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(4) මේ නියෝගයේ (2) වන ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් සේවා නියුක්තිය කෙළවර කර හෝ එම සේවා නියුක්තිය අත්හල ලෙස සැලකෙන සෑම තැනැත්තකු, ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් ඔහුට සපයන ලද යම් නිල නිවාසයකින්, එකී සේවා නියුක්තිය කෙළවර කිරීමේ හෝ අත් හැරීමේ දින සිට දිනතුනක් ඇතුළත ඉවත් විය යුතු ය. එම කාලසීමාව ඇතුළත එවැනි නිල නිවාසයකින් ඉවත්ව යාම පැහැර හරින කවර හෝ තැනැත්තෙක් මේ නියෝග යටතේ වරදක් කරන්නේ ය.

මේ ඡේදයෙහි "නිල නිවාසය" යන්නෙන්, පදිංචිව සිටින හෝ වාසය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ගොඩනැගිල්ලක් හෝ කාමරයක් හෝ වෙනත් ඉඩ පහසුකම් අදහස් වන අතර ඒ ගොඩනැගිල්ල, කාමරය හෝ වෙනත් ඉඩ පහසුකම පිහිටා තිබෙන යම් ඉඩමක් හෝ පරිශ්‍රයක් ඊට ඇතුළත් වේ.

(5) මේ නියෝගය යටතේ ඊට එරෙහිව යම් වරදක් සම්බන්ධයෙන් කවර හෝ අධිකරණයක් විසින් යම් තැනැත්තෙක් වරදකරු කරන ලද අවස්ථාවක, ඒ වරද සඳහා අධිකරණය නියම කරන වෙනත් යම් දණ්ඩනයකට අමතරව -

(අ) ඒ වරදකරු කිරීම ප්‍රකාර, ඒ තැනැත්තා සතු සියලු චංචල හෝ නිශ්චල දේපළ ජනරජය සතු වූ ලෙස සැලකිය යුතු ය ; තව ද

(ආ) මේ නියෝග බලාත්මක වූ දිනයෙන් පසු ඒ තැනැත්තා විසින් සිදු කරන ලද දේපළ අන්සතු කිරීමක් හෝ වෙනත් බැහැර කිරීමක් ශූන්‍ය බලරහිත ලෙස සැලකිය යුතු ය.

(6) යම් සේවයක්, ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අත්‍යවශ්‍ය සේවයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක අවශ්‍ය යයි සැලකෙන කල්හි, එසේ අත්‍යවශ්‍ය බවට ප්‍රකාශයට පත් කරන ලද එවැනි යම් සේවයක සේවයේ නියුක්ත කර සිටින හෝ ඒ යම් සේවයකට අයත් යම් නිලධරයකුගේ, සේවකයකුගේ, සේවා නියුක්තයකුගේ හෝ අනුයෝජිතයකුගේ සේවය, අදාළ විෂයය පවරා දෙනු ලැබ සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා, ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් අධිග්‍රහණය කරනු ලැබිය හැකි ය.

III වන කොටස

ඇතුළුවීමේ අයිතිවාසිකම් යනාදිය

අනවසර ඇතුළුවීම් වැළැක්වීම

10. (1) අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම පිණිස සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් වුවමනා හෝ ප්‍රයෝජනයට ගනු ලබන යම් ප්‍රදේශයකට, ස්ථානයකට හෝ පරිශ්‍රයකට අනවසර තැනැත්තන් ඇතුළුවීම වැළැක්වීම සඳහා විශේෂ පූර්වාරක්ෂා යෙදිය යුතු බව නිසි බලධරයකුගේ මතය වන්නේ නම්, ඒ බලධරයා විසින් නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චයකොට දැක්වෙන නියමයේ නිශ්චිතව සඳහන් කරන තැනැත්තකුගේ හෝ අවසරය නොමැතිව, කිසි තැනැත්තකු එම ප්‍රදේශයට හෝ ස්ථානයට හෝ පරිශ්‍රවලට ඇතුළු නොවිය යුතු බවට හෝ එහි රැඳී නොසිටිය යුතු බවට විධිවිධාන සැලැස්විය හැකි ය.

(2) මේ නියෝගය යටතේ කරන ලද නියමයක් උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු ඒ යම් ප්‍රදේශයක, ස්ථානයක හෝ පරිශ්‍රයක සිටියහොත්, ඔහුට විරුද්ධව පවත්වනු ලබන යම් නීති කෘත්‍යයකට අගතියක් නොමැතිව යම් පොලිස් නිලධරයකු, හෝ ශ්‍රී ලංකා යුධ හමුදාවේ සාමාජිකයකු, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයකු හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු විසින් හෝ නිසි බලධරයකු විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තා ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) මේ නියෝගයේ "නිසි බලධරයා" යන්න, යම් අත්‍යවශ්‍ය සේවයන් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ සේවයේ කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් නිසි බලධරයකු ලෙස නමින් හෝ නිලයෙන් පත් කරන ලද යම් තැනැත්තෙක් ඉන් අදහස් වේ.

IV වන කොටස

සෝදිසි කිරීම සහ වරද සඳහා සිරභාරයට ගැනීම

වැරදි සඳහා සෝදිසි කිරීම සහ සිරභාරයට ගැනීම

11. (1) යම් පොලිස් නිලධරයකු හෝ ශ්‍රී ලංකා යුධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු විසින්, හෝ මේ නියෝග යටතේ ක්‍රියා කිරීමට ජනාධිපතිවරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් මෙහි ඕනෑම නියෝගයක් යටතේ වන වරදක් හෝ (19 වන අධිකාරය වූ)දණ්ඩ නීති සංග්‍රහයේ 354 වන, 355 වන, 356 වන, 357 වන, 358 වන, 359 වන, 360අ වන, 360ආ වන සහ 360ඇ වන, වගන්ති සහ 364 වන, 365 වන, 365අ වන සහ 465ආ වන සහ 427 වන වගන්තියේ සිට 446 වන වගන්තිය දක්වා වන වගන්තිවලට ප්‍රකාරව යම් වරදක් සිදු කරන්නා වූ හෝ, සිදු කරනු ලැබ ඇති හෝ සිදු කර තිබීමට ප්‍රවේදිතාවක් දක්වා ඇති ලෙස හෝ සිදු කරනු ලැබූ ලෙස සැක කරනු ලැබීමට යුක්ති සහගත හේතු ඇත්තාවූ යම් තැනැත්තකු සෝදිසි කිරීම, එම සෝදිසි කිරීමේ කාර්ය සඳහා රඳවා තබා ගැනීම, හෝ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම සිදු කරනු ලැබිය හැකි අතර, එම වරද සිදු කිරීමේ දී කවර හෝ ආකාරයකින් භාවිත කරන ලද හෝ ඊට සම්බන්ධ යම් වාහනයක්, යාත්‍රාවක්, භාණ්ඩයක්. ද්‍රව්‍යයක් හෝ දෙයක් සෝදිසි කිරීම, තහනම් කිරීම, ඉවත් කිරීම සහ රඳවා තබා ගැනීම කළ හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ රඳවා තබා ගනු ලැබූ හෝ සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින් අත්අඩංගුවට ගනු ලැබූ යම් තැනැත්තකු පැය විසිහතරක් ඇතුළත ආසන්නතම පොලිස් ස්ථානය වෙත භාර දිය යුතු ය.

(3) පොලිස් නිලධරයකු විසින් අත්අඩංගුවට ගනු ලබන යම් තැනැත්තකු ආසන්නතම පොලිස් ස්ථානය වෙත ගෙන යනු ලැබිය යුතු ය.

(4) සෝදිසි කරනු ලැබූ ස්ථානයෙහි, භූමියෙහි, වාහනයෙහි හෝ යාත්‍රාවෙහි සිටි අන් කිසි තැනැත්තකුගෙන් හෝ සෝදිසි කරනු ලැබූ තැනැත්තාගෙන් සෝදිසි කිරීමේ කාර්යය හා සම්බන්ධ හෝ එයට අදාළ වූ හෝ යම් කරුණක් සම්බන්ධයෙන් මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ සෝදිසියක් පවත්වන තැනැත්තකු විසින් ප්‍රශ්න කළ හැකි ය.

(5) මේ නියෝගයේ (3) වන ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලැබූ සෑම තැනැත්තකුම විසින් ප්‍රශ්න කරනු ලැබූ කාරණය සම්බන්ධයෙන් තමා දන්නා යම් තොරතුරක් සැපයිය යුතු ය.

(6) මේ නියෝගය යටතේ සෝදිසි කළ යුතු යම් පරිශ්‍රයක, ස්ථානයක, වාහනයක හෝ යාත්‍රාවක පදිංචිව සිටින හෝ එවැනි පරිශ්‍රයක්, ස්ථානයක්, වාහනයක් හෝ යාත්‍රාවක් භාරව සිටින තැනැත්තකු විසින්, සෝදිසි පවත්වනු ලබන තැනැත්තාගේ ඉල්ලීම අනුව අවහිර නොමැතිව එම පරිශ්‍රයට, ස්ථානයට, වාහනයට හෝ යාත්‍රාවට ඔහුට ඇතුළු වීමට ඉඩ හැරීම හා එහි සෝදිසියක් කිරීම සඳහා සියලු යුක්ති සහගත පහසුකම් ඔහුට සැලසීම ද කළ යුතු ය.

(7) මේ නියෝගය යටතේ සෝදිසියක් පවත්වනු ලබන තැනැත්තා විසින් සෝදිසි කළ යුතු පරිශ්‍රයට, ස්ථානයට, වාහනයට හෝ ඒ යාත්‍රාවට ඇතුළු වීම සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක් විවෘත කළ හැකි ය. නැතහොත් කඩා විවෘත කළ හැකි ය.

(8) ස්ත්‍රියක සෝදිසි කිරීමට සැලැස්වීම අවශ්‍ය වන අවස්ථාවක එම සෝදිසිය වෙන ස්ත්‍රියක විසින් කළ යුතු ය.

(9) (1) ඡේදය යටතේ කරන ලද සිරභාරයට ගැනීම පිළිබඳව, සිරභාරයට ගැනීමේ නිලධරයා පොලිස් නිලධරයකු වන අවස්ථාවක, සිරභාරයට ගැනීම කරන ලද කොට්ඨාසයේ පොලිස් අධිකාරිවරයා වෙත ද, සිරභාරයට ගැනීමේ නිලධරයා සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වන අවස්ථාවක, සිරභාරයට ගැනීම කරන ලද ප්‍රදේශයේ අණදෙන නිලධරයා වෙත ද, එසේ සිරභාරයට ගැනීමෙන් පැය විසිහතරක් ඇතුළත වාර්තා කිරීම සිරභාරයට ගැනීමේ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(10) මේ නියෝගයේ විධිවිධාන යටතේ යම් දේපළක් ලබා ගන්නා ලද හෝ රඳවා තබා ගන්නා ලද අවස්ථාවක, එම දේපළ ලබා ගැනීම හෝ රඳවා තබා ගැනීම බලාත්මක කරනු ලබන තැනැත්තා විසින් එම දේපළ ලබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබුවේ යම් තැනැත්තකුගේ භාරයෙන් ද එම තැනැත්තාට ඒ දේපළ සම්බන්ධයෙන් ලදු පතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(11) ජනාධිපතිවරයා විසින් කලින් කලට කරනු ලබන නිමයක් මගින්, එම නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක පොදු පෙළපාලි හෝ පොදු රැස්වීම් පැවැත්වීම එම නියමයෙහි නිශ්චිතව සඳහන් නිදහස් කිරීම්වලට යටත්ව එහි නිශ්චිතව සඳහන් කාලසීමාවක් සඳහා තහනම් කරනු ලැබිය හැකි ය.

(12) පොලිස්පතිවරයා විසින්, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක් සම්බන්ධයෙන්, නියමයක් මගින් එම නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි නිදහස් කිරීම්වලට යටත්ව පොලිස් ස්ථානාධිපතිවරයකු විසින් දෙන ලද ලිඛිත අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර එම ප්‍රදේශයේ කිසිදු තැනැත්තකු විසින් එම නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පැය ගණනක් අතරතුර හෝ කාලසීමාවක් තුළ පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, උද්‍යානයක, විනෝද ක්‍රීඩාංගනයක හෝ වෙනත් යම් පොදු ස්ථානයක ගැවසීම සිදුනොකළ යුතු බවට විධාන කරනු ලැබිය හැකි ය.

V වන කොටස

වැරදි සහ දණ්ඩන

12. (1) (අ) යම් චංචල හෝ නිශ්චල දේපළකට විනාශයක් හෝ හානියක් සිදු කරන හෝ එවැනි යම් දේපළක වටිනාකම හෝ උපයෝගීතාවය විනාශ වීමට හෝ හීන වීමට හේතුවන ආකාරයට එවැනි දේපළක් වෙනස් කරනු ලබන ; හෝ වැරදි

(ආ) යම් තැනැත්තකු මරණයට පත් කිරීම සඳහා හෝ තුවාල සිදු කිරීම සඳහා කටයුතු කරන හෝ කටයුතු කිරීමට උත්සාහ කරනු ලබන ; හෝ

(ඈ) වෙනත් යම් තැනැත්තකු සාපරාධී ලෙස ත්‍රාසග්‍රහණය කරන හෝ එවැනි වෙනත් යම් තැනැත්තකුට පහර දෙන ; හෝ

(ඇ) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 345 වන, 354 වන, 355 වන, 356 වන, 357 වන, 358 වන, 359 වන, 360 වන, 360අ වන, 360ආ වන, 360ඇ වන, 364 වන හා 365 වන වගන්ති යටතේ යම් වරදක් සිදුකරනු ලබන; හෝ

(ඉ) යම් දේපළක් සොරකම් කරනු ලබන, පැහැර ගනු ලබන හෝ කොල්ලකනු ලබන ; හෝ

(ඊ) (19 වන අධිකාරය වූ)දණ්ඩ නීති සංග්‍රහයේ 427 වන වගන්තියේ සිට 446 වන වගන්තිය දක්වා වූ වගන්ති යටතේ වරදක් සිදුකරනු ලබන හෝ එවැනි යම් පරිශ්‍රයකින් යම් භාණ්ඩ හෝ අයිතම නීති විරෝධී ලෙස ඉවත් කරනු ලබන හෝ ඉවත් කිරීමට උත්සාහ කරනු ලබන ; හෝ

(උ) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 427 වන වගන්තියේ සිට 446 වන වගන්තිය දක්වා වූ වගන්ති යටතේ යම් වරදක් සිදු කරනු ලබන හෝ එවැනි යම් පරිශ්‍රයකින් භාණ්ඩ හෝ අයිතම නීතිවිරෝධී ලෙස ඉවත් කරනු ලබන හෝ ඉවත් කිරීමට උත්සාහ කරනු ලබන,ඕනෑම තැනැත්තකු වරදකට වරදකරු වන අතර, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ හෝ මේ නියෝගවල කුමක් සඳහන් වුව ද, මහාධිකරණය ඉදිරියේ ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමේ දී, ජීවිතාන්තය දක්වා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2)දේපළ පුද්ගලිකව ආරක්ෂා කිරීම පිළිබඳව අයිතිවාසිකමට අදාළ වන්නා වූ ද ඒ අයිතිවාසිකම ක්‍රියාවේ යෙදීමේ දී වරදක් කරන්නකුට මරණය හෝ වෙනත් හානියක් සිදු කරවනු ලැබිය හැකි අවස්ථා නියම කරන්නා වූ ද (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 96 වන වගන්තිය, ඒ වගන්තියේ අවසානයේ දී පහත දැක්වෙන පාඨය එකතු කරනු ලැබූ සේ බලපැවැත්විය යුතු යː-

"පස්වෙනුව - හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝගයන්හි 10 වන නියෝග යටතේ වූ යම් වරදක්.".

(3) (අ) වරද කරන වේලාවේ දී හෝ සිදු කරන අවස්ථාවෙහි පැවති යම් සිවිල් කැළඹීම් හෝ වාර්ගික වශයෙන් උනන්දු කරවනු ලැබූ කැරලි වර්ධනය කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් හෝ එවැනි අවස්ථාවල දී වරද කරනු ලැබූ බවට නීතිපතිවරයා සෑහීමට පත් වන්නේ නම් ඔහු විසින් හදිසි අවස්ථා නියෝග යටතේ එම වරද සම්බන්ධයෙන් අධිචෝදනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි යː

එසේ වුව ද, යම් වරදක් සිදු කිරීමට අදාළ අවස්ථානුගත කරුණු පිළිබඳ සැලකිල්ලට ගැනීමෙන් පසුව, නීතිපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වරද හෝ වැරදි වර්ග සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ දී නඩු කටයුතු ආරම්භ කිරීමට නීතිපතිවරයා විසින් පොලිස්පතිවරයාට බලය පවරනු ලැබිය හැකි අතර, ඉන් අනතුරුව එම කටයුතු පොලිස්පතිවරයාගේ ලිඛිත බලය පැවරීම මත එවැනි නඩු කටයුතු ආරම්භ කරනු ලැබිය හැකි අතර, එවැනි වැරදි සම්බන්ධයෙන් නඩු විභාගයට අදාළව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XVII පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.

(ආ) මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ගොනු කරනු ලබන අවස්ථාවක දී, එම නියෝගවල විධිවිධාන සලස්වා ඇති දණ්ඩනයෙන් එම වරද සඳහා දඬුවම් කරනු ලැබිය යුතු ය.

අප්‍රසාදය වැළැක්වීම

13. කිසිම තැනැත්තකු විසින් -

(අ) (i) රජයේ නිලධරයන් වන්නා වූ; හෝ

(ii) ජනරජයේ සේවයෙහි නියුක්ත වන්නා වූ; හෝ

(iii) අත්‍යවශ්‍ය සේවාවල කාර්ය සාධනයේ යෙදී සිටින්නා වූ,

තැනැත්තන් අතර, අප්‍රසාදය ඇති කිරීම සඳහා; හෝ

(ආ) රජයේ නිලධරයකු වශයෙන් හෝ එවැනි උල්ලංඝනය කිරීමක් සංයුක්ත විය හැකි ඉහත කී තැනැත්තකු වශයෙන් ස්වකීය කාර්යය ඉටුකිරීම උල්ලංඝනය කරමින් යම් ක්‍රියාවක් සිදු කිරීමේ හෝ සිදු කිරීමෙන් වැළකීම සඳහා (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු පෙළඹවීම සඳහා,

උත්සාහ කරනු නොලැබිය යුතු ය.

14. කිසිදු තැනැත්තකු විසින් මහජන ආරක්ෂාවට, මහජන යථා පැවැත්මට හෝ ප්‍රජා ජන ජීවිතය අත්‍යවශ්‍ය සැපයීම් සහ සේවා පවත්වාගෙන යෑමට අගතිගාමී වන්නා වූ කරුණු අන්තර්ගත පෝස්ටර්, අත්පත්‍රිකා හෝ පත්‍රිකා, මහජනතාවට දෘශ්‍යමානවන යම් ස්ථානයක ඇලවීම හෝ මහජනතාව අතර, බෙදා හැරීම නොකළ යුතු ය. **පත්‍රිකා ආදිය බෙදා දීම**

15. මහජනයා බිය ගැන්වීම හෝ මහජන කලහය, වාර්ගික ප්‍රචණ්ඩත්වය ඇති කළහැකි හෝ යම් වරදක් සිදු කිරීමට පෙලඹවිය හැකි කිසිදු කටකතාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් හෝ කිසිදු තොරතුරක් හෝ ප්‍රතිරූපයක් හෝ පණිවිඩයක් කටවචනයක් හෝ ඩිජිටල් සහ හෝ සමාජ මාධ්‍ය හරහා ඇතුළු කවර වූ හෝ වෙනත් ක්‍රමයකින් සන්නිවේදනය හෝ පැතිරවීම කිසිදු තැනැත්තකු විසින් සිදු නොකරනු ලැබිය යුතු ය. **කටකතා හා ව්‍යාජ ප්‍රකාශ සන්නිවේදනය හෝ පැතිරවීම**

16. (අ) යම් හදිසි අවස්ථා නියෝගය ප්‍රකාර හෝ එවැනි යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ යම් ආඥාවක් ප්‍රකාර හෝ කරනු ලැබූ ඉල්ලීමකට පිළිතුරු වශයෙන් සැලකිය යුතු කාරණයක් සම්බන්ධයෙන් අසත්‍ය බව තමා දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතුවක් තමාට ඇත්තා වූ යම් ප්‍රකාශයක් කළහොත් හෝ එවැනි යම් තොරතුරක් සපයනු ලබන; හෝ **අසත්‍ය ප්‍රකාශ**

(ආ) ඔහු විසින් පිළියෙල කළ යුතු යයි යම් හදිසි අවස්ථා නියෝගයකින් හෝ හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ ආඥාවක් ප්‍රකාර හෝ නියම කරනු ලැබූ යම් ගිණුමක, ප්‍රකාශයක, තක්සේරුවක, වාර්තාවක හෝ වෙනත් යම් ලේඛනයක ඉහත සඳහන් පරිදි ප්‍රකාශයක් කරනු ලබන, යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

17. (1) මේ නියෝගයන් ප්‍රකාරව සිරභාරයට ගන්නා ලද යම් තැනැත්තකු නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නිකුත් කරන ලද නියෝගයක් ප්‍රකාරව විමර්ශන කාර්යය සඳහා රඳවා තබා ගනු ලැබිය හැකි ය. එකී නියෝගයේ දක්වා ඇති කොන්දේසි සමග අනුකූලව එකී තැනැත්තා දින දාහතරක් නොඉක්මවන කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු ලැබිය යුතු ය. **විමර්ශන කාර්යය සඳහා රඳවා තබා ගැනීම.**

(2) ඔහුගේ රඳවා තබා ගැනීම සඳහා නියමයක් එම නියෝග ප්‍රකාරව නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් සිදුකර ඇත්තේ නම් මිස, පූර්ව නියෝග ප්‍රකාරව සිරභාරයට ගන්නා ලද යම් තැනැත්තකු හැකි ඉක්මනින් පොලිස් ස්ථානයකට ගෙන ආ යුතු අතර, දින විසි හතරක් නොඉක්මවන කාලසීමාවක් සඳහා එහි රඳවා තබා ගත යුතු මෙන්ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

18. (1) කිසිම තැනැත්තකු වෙනත් යම් තැනැත්තකු වාසය කරන, වැඩකරන හෝ ව්‍යාපාර කටයුතු ගෙන යන හෝ සිටින යම් නිවසක් හෝ ස්ථානයක් ආසන්නයට හෝ නිවසකට හෝ ස්ථානයකට එම නිවසේ හෝ ස්ථානයේ යම් තැනැත්තකු භය ගන්වන ආකාරයෙන් හෝ ඒ ගෙයට හෝ ස්ථානයට ඇතුළු වීම හෝ ඉන් පිටවීම අවහිර කරන ආකාරයෙන් හෝ සාමය කඩවීමට තුඩු දෙන ආකාරයෙන් හෝ ඒ ගෙයට නැතහොත් ස්ථානයට හෝ ඒ අසළට කිසිදු තැනැත්තකු නොයා යුතු ය. **භය ගැන්වීම වැළැක්වීම**

(2) මේ නියෝගයෙහි "භය ගැන්වීම" යන යෙදුමෙන් යම් තැනැත්තකුට හෝ සිය පවුලේ යම් සාමාජිකයකුට හෝ තමාගෙන් යැපෙන යම් තැනැත්තකුට හෝ හානියක් සිදුවේ යැයි නැතහොත් යම් තැනැත්තකුට හෝ දේපළකට සාහසික ක්‍රියාවක් හෝ අලාභයක් සිදු වේ යයි යුක්ති සහගත හැඟීමක් යම් තැනැත්තකුගේ සිතේ ජනිත කරවීම අදහස් වන අතර, "හානිය" යන යෙදුමට යම් තැනැත්තකුගේ ව්‍යාපාරය, වෘත්තිය, සේවා නියුක්තිය හෝ වෙනත් ආදායම් මාර්ගයක් සම්බන්ධයෙන් ඔහුට සිදුවන යම් හානියක් ඇතුළත් වන අතර, නඩු පැවරිය හැකි යම් සිවිල් වරදක් ද ඊට ඇතුළත් වේ.

19. කිසිම තැනැත්තකු, යම් හදිසි අවස්ථා නියෝගයකින් හෝ ඒ යටතේ යම් තැනැත්තකු පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලතල හෝ කාර්යය ක්‍රියාවේ යෙදවීමේ දී ඒ තැනැත්තාට විරෝධය පෑම හෝ අවහිර කිරීම නොකළ යුතු ය. **බලය දරන තැනැත්තන්ට විරෝධය පෑම හෝ අවහිර කිරීම**

20.කිසිම තැනැත්තකු නීත්‍යානුකූල බලයක් නොමැතිව පොදු මාර්ගයකට, පාලමකට හෝ බෝක්කුවකට හෝ යම් දුම්රිය මාර්ගයකට හෝ වාහන ප්‍රවාහනය අවහිර කිරීම හෝ ඒවාට හානි කිරීම නොකළ යුතු ය. **මාර්ග, දුම්රිය මාර්ග ආදිය අවහිර කිරීම හෝ ඒවාට හානි කිරීම**

වැරදි කිරීමට තැත් කිරීම යනාදිය

21. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් කිරීමට -

(අ) තැත් කරන හෝ කිරීමට සූදානම් වීමේ යම් ක්‍රියාවක් කරන, හෝ

(ආ) අන් තැනැත්තකුට ආධාර හෝ අනුබල දෙන; හෝ

(ඇ) අන් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන, යම් තැනැත්තකු ඒ වරදට වරදකරු විය යුතු අතර, ඒ අනුව ඒ වරද සඳහා හදිසි අවස්ථා නියෝග යටතේ නියම කර ඇති ආකාරයට නඩු විභාගයකට ඔහු භාජනය කර හදිසි අවස්ථා නියෝග යටතේ ඒ වරදට නියමිත දඬුවමෙන් ම ඔහුට දඬුවම් කළ යුතු ය.

වරදකට සහාය දීම

22. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතෙහි වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු බව දන්නා හෝ ඒ බව විශ්වාස කිරීමට සෑහෙන හේතු ඇති කිසිම තැනැත්තකු විසින් එකී වරද සඳහා ඉහත කී තැනැත්තා අල්ලා ගැනීමට, ඔහුට විරුද්ධව නඩු විභාග කිරීම හෝ ඔහුට දඬුවම් දීම වැළැක්වීමේ, ඊට බාධා කිරීමේ හෝ මැදිහත්වීමේ අදහසින් ඒ තැනැත්තාට කිසිම සහායක් නොදිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි

23. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක -

(අ) ඒ මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම ; සහ

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකුම, එම වරද තමාගේ දැනුම නොමැතිව සිදුකර ඇති බව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීමට තමා සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු වශයෙන් සැලකිය යුතු ය.

දණ්ඩන

24. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් හෝ එවැනි යම් නියෝගයක් යටතේ සාදනු ලැබූ යම් නියමයක් හෝ යම් රීතියක් හෝ එවැනි නියෝගයක් යටතේ දෙනු ලැබූ විධානයක් හෝ පනවනු ලැබූ යම් නියමයක් හෝ යම් තැනැත්තකු විසින් උල්ලංඝනය කරහොත් හෝ එවැන්නකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරියහොත් ඔහු වරදකට වරදකරුවන අතර, මහාධිකරණය ඉදිරියේ ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන නැතහොත් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට, ඒ නියෝගයෙහි සඳහන් යම් විශේෂ විධිවිධානවලට යටත් ව, මාස තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

(2) එම නියෝගය යටතේ වූ යම් වරදක් සඳහා කිසිදු දණ්ඩනයක් නියම කර නොමැති අවස්ථාවක දී, ඒ වරද සම්බන්ධයෙන් මහාධිකරණය ඉදිරියේ ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන හෝ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් විය යුතු ය.

(3) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදකට වරදකරු වූ යම් තැනැත්තකුට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන සහ 306 වන වගන්ති අදාළ නොවිය යුතු ය.

VI වන කොටස

විමර්ශන, නඩු විභාග ආදිය

තොරතුරු එළිදරව් කිරීමේ යුතුකම

25. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් කිරීමේ චේතනාවක්, ප්‍රයත්නයක් හෝ සූදානමක් ගැන හෝ එවැනි වරදක් සිදු කිරීම පිළිබඳව හෝ දැනගන්නා කවරෙකු වුවද, ඒ පිළිබඳ තොරතුරු ආසන්නතම ග්‍රාම නිලධරයන්ට හෝ ආසන්නතම පොලිස් ස්ථානය භාරව සිටින නිලධරයාට වහාම දැන්විය යුතු ය.

(2) (1) ඡේදයේ සඳහන් තොරතුරු දැන්වීම ඕනෑකමින්ම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන්නේ ය.

(3) හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධ යම් තොරතුරක් ලැබුණු රාජ්‍ය සේවකයකු හෝ යම් ග්‍රාම නිලධාරියකු විසින් ඒ තොරතුරු වහාම ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙත දැන්විය යුතු ය.

විමර්ශනය කිරීම සඳහා පොලිස් නිලධරයන්ගේ බලතල

26. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් විමර්ශනය කරන යම් පොලිස් නිලධරයකු විසින් -

(අ) වරද සම්බන්ධ කරුණු අවස්ථාගත සිද්ධීන් පිළිබඳ යම් තැනැත්තකුගෙන් වාචික ප්‍රශ්න අසා එසේ ප්‍රශ්න කරන ලද තැනැත්තා කරනු ලැබූ යම් ප්‍රකාශයක් ලියා ගත හැකි ය ඃ

එසේ වුව ද, එවැනි ප්‍රකාශයක් ලියවිල්ලක් බවට පත් කරනු ලැබූ පසු එම ප්‍රකාශය කරන තැනැත්තා විසින් මෙන්ම එය සටහන් කරන පොලිස් නිලධරයා විසින් එම ප්‍රකාශයට අත්සන් කළ යුතු ය :

එසේ ම තවදුරටත්, ප්‍රකාශයට අත්සන් තැබීමට යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කළ අවස්ථාවක එම ප්‍රතික්ෂේප කිරීම පොලිස් නිලධරයා විසින් සටහන් කරගත යුතු ය.

(ආ) ඒ තැනැත්තාගේ ආදර්ශ අත් අකුරු, ඡායාරූප, ඇඟිලි සටහන් සහ වෙනත් හඳුනා ගැනීමේ ලක්ෂණ ලබා ගත යුතු ය;

(ඇ) ඒ තැනැත්තා සෝදිසි කළ හැකි ය; නැතහොත් ඒ තැනැත්තා වාසය කරන නිවස හෝ වැඩ කරන ස්ථානයට ඇතුළු වී ඒ නිවස හෝ ස්ථානය සෝදිසි කළ හැකි ය ;

(ඈ) එකී යම් වරදක් හා සම්බන්ධ හෝ සම්බන්ධ යයි සැක කරනු ලබන ස්ථානයක් ගොඩනැගිල්ලක් වාහනයක් යාත්‍රාවක් තුළට ඇතුළු වී පරීක්ෂා කිරීම ;

(ඉ) යම් විදුලි පණිවිඩයක්, තැපැල් ලේඛනයක් හෝ යම් බැංකුවක ඇති වෙනත් පොතක් හෝ ලේඛනයක් ඇතුළුව, කවරාකාරයක වූ යම් චංචල දේපළක් පරීක්ෂා කොට තම සන්තකයට ගත හැකි ය :

එසේ වුව ද, යම් බැංකුවකින් හෝ තැපැල් කාර්යාලයකින් යම් පොතක් හෝ ලේඛනයක් ලබා ගැනීමට බලාපොරොත්තු වීමට පෙර, තනතුරින් සහකාර පොලිස් අධිකාරිවරයකුට වඩා තනතුරින් අඩු නොවූ පොලිස් නිලධරයකු විසින් ඒ පොත හෝ ලේඛනය විමර්ශනයේ කාර්යයන් සඳහා අවශ්‍ය ව, අවස්ථාවෝචිත පරිදි, ඒ බැංකුව හෝ තැපැල් කාර්යාලය භාරව සිටින කළමනාකරු හෝ නිලධරයා වෙත කලින් ලියා දැන්විය යුතු ය.

සැක කරනු ලබන තැනැත්තන් සන්තකයෙහි තිබෙන ලේඛන

27. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ යම් වරදකට සම්බන්ධ යයි සැක කෙරෙන තැනැත්තකුගේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තිබී සොයාගනු ලබන යම් පොතක්, ලේඛනයක් හෝ පත්‍රිකාවක් ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධ කෙරෙන යම් නීති කෘත්‍යවලදී අදාළ විය යුතු අතර ඒ පොතේ, ලේඛනයේ හෝ පත්‍රිකාවේ අඩංගු කරුණු ඔප්පු කිරීමක් නොමැති ව සාක්ෂි වශයෙන් පිළිගත හැකි විය යුතු ය.

ප්‍රශ්න කිරීමේ අයිතිවාසිකම හා සහාය වීමේ යුතුකම

28. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳ විමර්ශනය කරන, හදිසි නියෝග යටතේ විධිමත් ලෙස බලය පවරනු ලැබූ පොලිස් නිලධරයකු හෝ තැනැත්තකු, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත් ද -

(අ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ රඳවා ගනු ලැබ සිටින හෝ අත්අඩංගුවේ තබා ගනු ලැබ සිටින තැනැත්තකු ඇතුළු යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ සහ එසේ ප්‍රශ්න කරන කාලය තුළ දී එම විමර්ශනයේ කාර්යය සඳහා ඒ තැනැත්තා ස්ථානයෙන් ස්ථානයට ගෙන යෑමේ අයිතිවාසිකම තිබිය යුතු ය ; තව ද,

(ආ) ඒ විමර්ශනයේ කාර්යය සඳහා අවශ්‍යවන ලිපි ලේඛන ඇතුළු ව යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක් එසේ ප්‍රශ්න කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයෙන් තමාගේ භාරයට ගැනීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයකුට හෝ නිසි බලය ලැබූ වෙනත් තැනැත්තකුට සෑම සහයෝගයක් ම දීම සෑම තැනැත්තකුගේම යුතුකම විය යුතු අතර මේ නියෝගයේ (1) වන ඡේදයේ (අ) අනුඡේදය යටතේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තකුම ඔහුගෙන් අසනු ලබන සියලුම ප්‍රශ්නවලට සත්‍යවාදී ලෙස පිළිතුරු දිය යුතු අතර, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත් ද, යම් ලේඛනයක අඩංගු කරුණු ඇතුළුව විමර්ශනයට විෂය වූ කරුණට අදාළ ව යම් ලේඛනයක අඩංගු කරුණු ඇතුළු

සියලු තොරතුරු, එම තොරතුරු හෝ එම ලේඛනවල අඩංගු කරුණු පිළිබඳ දැනීම එම තැනැත්තාට ලැබී ඇත්තේ ඔහු දරන කවර තත්ත්වයක් නිසා වුව ද එය නොසලකා අනාවරණය කළ යුතු ය.

(3) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලබන තැනැත්තකු භාරයේ හෝ සන්තකයේ ඇති ලිපිලේඛනයක් ඇතුළු යම් භාණ්ඩයක් හෝ වෙනත් යම් දෙයක් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පිළිබඳ ව විමර්ශනය කරන පොලිස් නිලධරයකු වෙත හෝ නිසි ලෙස බලය පවරනු ලැබූ තැනැත්තකු වෙත භාර දෙන ලෙස, ඒ පොලිස් නිලධරයා හෝ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් විධාන කරනු ලැබූ කල්හි එසේ භාර දීම එසේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තකුගේ ම යුතුකම විය යුතු ය.

(4) මේ නියෝගයේ විධිවිධානවලින් යමක් උල්ලංඝනය කිරීම හෝ ඒ යටතේ නියම කරන ලද යම් යුතුකමක් කඩ කිරීම මේ හදිසි අවස්ථා නියෝග යටතේ වූ වරදක් විය යුතු ය.

ප්‍රවේශ වීමේ අයිතිවාසිකම පොලිස් නිලධරයකු සතු බව

29. යම් තැනැත්තකු රඳවා ගෙන හෝ අත්අඩංගුවේ තබාගෙන ඇති කාලසීමාව තුළම විමර්ශනයේ කාර්යය සඳහා සාධාරණ කාලවේලාවන් හි දී යම් තැනැත්තකු වෙත යාමේ අයිතිය යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳ විමර්ශනය කරන පොලිස් නිලධරයකු සතුව තිබිය යුතු ය.

වෙනත් බලතලවලට අතිරේකව පොලිස් නිලධරයන්ගේ බලතල

30. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකු සතු බලතල, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඔහු සතු බලතලවලට අතිරේකව මිස, ඒ බලතල හීන කිරීමක් නොවිය යුතු ය.

අධිකරණයක පැවැත්වෙන යම් නීති කෘත්‍යයකට ප්‍රමුඛතාව හිමි විය යුතු බව

31. යම් හදිසි අවස්ථා නියෝග යටතේ යම් තැනැත්තකු විසින් කරනු ලැබී යයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පැවැත්වෙන යම් නීති කෘත්‍යයක්, ඒ අධිකරණයේ වෙනත් යම් කටයුතුවලට පෙර විභාග කරනු ලැබිය යුතු ය.

පරීක්ෂණ සහ නඩු විභාග

32. (1) මෙහි ලා අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇති පරිදි හැර සහ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත් ද, යම් අවස්ථා නියෝගයක් යටතේ තැනැත්තකු විසින් කර ඇතැයි කියනු ලබන වරදක් පිළිබඳ නඩු කටයුතු තත් කාලයේ ඒ තැනැත්තා සිටින ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති ශ්‍රී ලංකාවේ නිසි අධිකරණය ඉදිරියෙහි ආරම්භ කළ හැකි ය.

(2) (අ) හදිසි අවස්ථා නියෝග යටතේ පුද්ගලයන් විසින් කර ඇතැයි කියනු ලබන වැරදි; හෝ

(ආ) ඒ නියෝග යටතේ, කෙලින් ම හෝ අනියම් ලෙසින් යම් බලයක් පාවිච්චි කිරීම හෝ යුතුකමක් ඉටු කිරීම නැතහොත් කල්පිත පාවිච්චි කිරීම හෝ කල්පිත ඉටු කිරීම හෝ හේතු කොට ගෙන හෝ එයින් උද්ගත වූ නැතහොත් ඒ පාවිච්චි කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාවලින් වෙන යම් ලිඛිත නීතියක් යටතේ යම් වැරදි සංයුක්ත වේ ද යම් තැනැත්තන් විසින් කරන ලදැයි කියනු ලබන එවැනි වැරදි,

පිළිබඳ පරීක්ෂණය කවර අධිකරණයක දී පවත්වා නඩු විභාග කළයුතු දැයි නීතිපතිවරයා විසින් තීරණය කළ හැකි ය. ඒ අධිකරණය ස්වකීය ප්‍රාදේශීය බල සීමාව ඇතුළත දී ඒ වරදවල් කරනු ලැබූයේ නම්, ඒ වරදවල් පිළිබඳ පරීක්ෂණ පවත්වා නඩු විභාග කළ හැකි ව තිබූ අධිකරණයක් විය යුතු ය.

(3) යටත් පිරිසෙයින් එක් චෝදනාවක් හෝ (2) වන ඡේදයේ (ආ) උපඡේදයේ සඳහන් වැරදිවලින් යම් වරදක් සම්බන්ධයෙන් වන විට නීතිපතිවරයා විසින් වෙනත් යම් ලිඛිත නීතියක කවර විධිවිධානයක් තිබුණ ද මහාධිකරණය වෙත කෙලින්ම අධි චෝදනාවක් යොමු කළ හැකි අතර, එසේ යොමු කරන ලද අධිචෝදනාව මත ජූරියක් නොමැතිව චූදිතයාට එරෙහිව නඩු විභාග කළ හැකි ය.

(4) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ නීතිපතිවරයා විසින් යම් වරදක් ගැන පරීක්ෂණ පැවැත්වීම හෝ නඩු විභාග කිරීම කළ යුත්තේ කුමන අධිකරණයක් විසින් ද යන්න තීරණය කර ඇති විට දී ඔහු විසින් තම ලිඛිත නියෝගයක් මගින් එකී වරද පිළිබඳ පරීක්ෂණ පැවැත්විය යුතු හෝ නඩු විභාග කිරීම කළයුතු අධිකරණය වශයෙන් ඒ අධිකරණය නම් කළ යුතු අතර, ඒ අනුව අධිකරණය විසින් ඒ නියෝගයේ බලය ප්‍රකාර පරීක්ෂණ හෝ නඩු විභාගය පවත්වා ඒ නියෝගය ඒ පරීක්ෂණයේ හෝ නඩු විභාගයේ නඩු කටයුතු වාර්තා සමග ගොනු කොට තැබිය යුතු ය.

(5) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ නීතිපතිවරයා විසින් කරනු ලබන තීරණයක් -

(අ) හදිසි අවස්ථා නියෝග යටතේ තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලේ ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන වැරදිවලට ත හෝ

(ආ) යම් විශේෂ පන්තියක හෝ වර්ගයක තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන සියලු වැරදිවලට ; හෝ

(ඇ) තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලේ ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන යම් විශේෂ පන්තියකට හෝ වර්ගයකට අයත් සියලු වැරදිවලට ; හෝ

(ඈ) යම් විශේෂ පන්තියකට හෝ වර්ගයකට අයත් තැනැත්තන් විසින් හෝ යම් විශේෂ තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව මුළුල්ලේ ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කර ඇතැයි කියනු ලබන යම් විශේෂ පන්තියකට හෝ වර්ගයකට අයත් සියලු වැරදිවලට ; හෝ

(ඉ) යම් විශේෂ තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහි ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කර ඇතැයි කියනු ලබන යම් විශේෂ වරදක්,

අදාළ කළ හැකි ය.

(6) මෙම නියෝග බලපවත්වන කාලය තුළ යම් සාපරාධී වරදක් පිළිබඳ යම් විභාගයක් (හෝ නඩු විභාගයක්) යම් අධිකරණයක හෝ ස්ථානයක සිට වෙනයම් අධිකරණයකට හෝ ස්ථානයකට මාරු කිරීමට නීතිපතිවරයාට බලය පවරන ලද 1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ 47වන වගන්තිය, එම වගන්තියේ (2) වන උපවගන්තිය බලාත්මක නොවූ සේ ක්‍රියාත්මක විය යුතු ය.

නීතිපතිවරයාගේ අවසරය

33. (1) 16 වන නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව -

(අ) යම් හදිසි අවස්ථා නියෝගයකට විරුද්ධව වරදක් සඳහා ; හෝ

(ආ) ඒ නියෝගය යටතේ යම් බලයක් හෝ කාර්යයක් කෙලින් ම හෝ අන්‍යාකාරයකින් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී හෝ කල්පිත ක්‍රියාත්මක කරවීමේ දී හෝ ඉටු කිරීමේ දී, කිරීමෙන් හෝ නොකර හැරීමෙන් උද්ගත හෝ නැතහොත් ඇති වූ වරදකිත් සංගෘහිත වන ක්‍රියාව හෝ නොකර හැරීම වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ තැනැත්තන් විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන වරදක් සඳහා ; හෝ

මහෙස්ත්‍රාත් අධිකරණයේ කිසිදු නඩු පැවරීමක් නීතිපතිවරයා විසින් ලියවිල්ලකින් දෙනු ලබන අනුමතය මගින් හෝ ඒ අනුමතය මත හැර නොකළ යුතු ය.

(2)ආඥාවෙහි නියම කරනු ලැබූ යම් හදිසි අවස්ථා නියෝගයකට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් මේ නියෝගයේ (1) වන ඡේදයෙහි විධිවිධාන අදාළ නොවිය යුතු යයි ජනාධිපතිවරයා විසින් ආඥාවෙන් ප්‍රකාශ කළ හැකිය. තව ද, ආඥාව බලපවත්වනතාක් එවැනි වරදකට ඒ ඡේදය අදාළ නොවිය යුතු ය.

මහාධිකරණ ඉදිරියේ නඩු විභාගය

34. (1) යම් හදිසි අවස්ථා නියෝගයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද, හදිසි අවස්ථා නියෝග යටතේ යම් වරදක් සම්බන්ධයෙන් විශේෂ අධිකරණ විභාගයක් ඇතුළු ව නඩු විභාගය නීතිපතිවරයා විසින් අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට, පවත්වනු ලැබිය හැකි අතර, එවිට චෝදනාවකට ලක් වූ තැනැත්තාට විරුද්ධව අවස්ථාවෝචිත පරිදි ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියේ මූලික පරීක්ෂණයක් නොමැතිව නඩු විභාග කළයුතු ය :

එසේ වුව ද, මූලික පරීක්ෂණයක දී වාර්තාගත කරනු ලැබූ සාක්ෂි, අධිචෝදනාවක් සකස් කිරීම සඳහා අවශ්‍ය බව නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක මූලික පරීක්ෂණ යක් පැවැත්වීම, ඔහු විසින් විධානය කළ හැකි ය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ XV වන පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ මූලික පරීක්ෂණ අදාළ විය යුතු ය.

(2) මේ නියෝගය යටතේ වරදක් සිදුකර තිබීම සම්බන්ධයෙන් සැක කරනු ලැබ සිටින හෝ චූදිත තැනැත්තකුට විශේෂ අවස්ථානුගත කරුණු යටතේ හැර ඇප ලබා නොදිය යුතු ය.

(3) මේ නියෝග යටතේ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඇතුළු ව මහාධිකරණ ඉදිරියෙහි වූ නඩු විභාගයක්, අවස්ථාවෝචිත පරිදි ජූරි සභාවක් නොමැතිව මහාධිකරණය ඉදිරියෙහි හෝ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියේ නඩු විභාග සම්බන්ධයෙන් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැකිතාක් ඉක්මනින් පැවැත්විය යුතු ය.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

35. හදිසි අවස්ථා නියෝග යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණවලට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

VII වන කොටස

විවිධ

විවිධ බලතල

36. (1) මේ නියෝගය බලපැවැත්වෙන අතර තත්ත්වයෙන් සැරයන් කෙනෙකුට නොඅඩු තත්ත්වයක සිටින යම් පොලිස් නිලධරයකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නොඅඩු තත්වයක සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යම් සාමාජිකයෙකු විසින් හෝ තත්වයෙන් ප්‍රධාන නැවියකුට නොඅඩු ත්ත්වයක සිටින ශ්‍රී ලංකා නාවික හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නොඅඩු තත්වයක සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ යම් පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු පිට්ටනියක, පොදු විනෝද ක්‍රීඩා භූමියක හෝ වෙනත් පොදු භූමියක, මුහුදු වෙරළක හෝ යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් අසළ හෝ එකී භූමියෙහි සිටින යම් තැනැත්තකු හෝ තැනැත්තන්ට ඒ ස්ථානයෙන් ඉවත්ව යාමට අණ කළ හැකි ය. තව ද, ඒ ආඥාව පිළිපැදීම අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ හෝ ඒ එක් එක් තැනැත්තාගේ යුතුකම විය යුතුය.

(2) නියමයක් නිකුත් කිරීමට බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් මේ නියෝගයේ (1) වන ඡේදයේ (ආ) අනුඡේදය යටතේ නියමයක් නිකුත් කරනු ලැබූ විට යම් තැනැත්තකු ඒ නියමයට අනුකූලව ක්‍රියා නොකරන්නේ නම් හෝ, එම නියමයට අනුකූලව ක්‍රියා නොකිරීමේ අධිෂ්ඨානයක් පෙන්වන ආකාරයට හැසිරෙන්නේ නම් ඒ නිලධරයා විසින්, අවශ්‍ය විය හැකි යම් සහායක් ඇතිව, සන්නද්ධ බලය ඇතුළු බලයෙන් ඒ නියමය ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කළ හැකි අතර, ඒ තැනැත්තා ඉවත් කිරීමට හෝ සිරභාරයට ගෙන රඳවා තැබීමට සැළැස්විය හැකි ය.

(3) මේ නියෝගය බලපවත්නා කාලය තුළ 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 306 (1), (2) සහ (4) වන වගන්ති, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඇති යුතුකම

37. (1) වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගනු ලැබූ යම් තැනැත්තකු, එසේ අත් අඩංගුවට ගෙන රඳවා තබාගෙන ඇති කාල සීමාව ඇතුළත පොලිස් නිලධරයකු විසින් හෝ යුධ හමුදාපති, නාවුක හමුදාධිපති හෝ ගුවන් හමුදාධිපති විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් හෝ ප්‍රශ්න කරනු ලැබිය හැකි ය. තව ද, තමාගෙන් අසනු ලැබූ ප්‍රශ්නයකට පිළිතුරු දීම එසේ ප්‍රශ්න කරනු ලැබූ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ අත්අඩංගුවට ගෙන රඳවා ගෙන ඇති යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා හෝ ඒ ප්‍රශ්න කිරීමට සම්බන්ධව වෙනත් යම් කාර්යයක් සඳහා ඒ තැනැත්තා මේ නියෝගයේ (1) වන ඡේදයේ සඳහන් යම් නිලධරයකු විසින් ඔහු රඳවා ගෙන හෝ අත්අඩංගුවේ තබා ගෙන ඇති යම් ස්ථානයකින් ඉවත් කොට එක් වරකට දින හතකට නොවැඩි කාලයක් එම නිලධරයාගේ තාවකාලික අත්අඩංගුවේ තබා ගත හැකි ය.

තොරතුරු ලබාගැනීම හෝ ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ බලය

38. (1) මේ නියෝගවල අඩංගු විශේෂ විධිවිධානවලට අගතියක් නොමැතිව, නිසි බලධාරියා විසින් ඔහු වෙනුවෙන් ඉල්ලීමක් කළ විට, ජාතික ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය පවත්වාගෙන යාම සඳහා හෝ යයි හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා හෝ ලබාගැනීමට හෝ පරීක්ෂා කරනු ලැබීමට, අවශ්‍ය හෝ යෝග්‍ය යයි බලධරයා හෝ ඉල්ලීමක් කරන තැනැත්තා හෝ අදහස් කරන්නාවූ ද, ඉල්ලීමෙහි සඳහන් බලධරයාට හෝ තැනැත්තාට යට කී තැනැත්තා විසින් සැපයිය යුතු ය. නැතහොත් ඉදිරිපත් කළ යුතු ය. තව ද මේ නියෝගය යටතේ යථා පරිදි ඔහු වෙත කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර, යම් තොරතුරක් හෝ තම සන්තකයෙහි ඇති භාණ්ඩයක් සැපයුම හෝ ඉදිරිපත් කිරීම යම් කෙනෙකු විසින් පැහැර හැරියහොත් ඔහු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) මේ නියෝගයේ "භාණ්ඩය" යන්නට යම් පොතක්, ගිණුමක් හෝ ලේඛනයක් ඇතුළත් වෙයි.

මෝටර් වාහන පනතේ ඇතැම් විධිවිධානවලින් සන්නද්ධ හමුදාවල සාමාජිකයන් නිදහස් කිරීම

39. මහජන සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා යම් මෝටර් වාහනයක් පදවන ලෙස නිසි බලධරයා විසින් බලය පවරනු ලැබ, ශ්‍රී ලංකා යුධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු යම් මෝටර් වාහනයක් එසේ පදවන විට, මෝටර් වාහන පනත යටතේ සාදන ලද නියෝග අතුරෙන් 1955 ජුලි 8 වන දින අංක 10,815 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන 1955 මෝටර් වාහන (මහරැජිනගේ හමුදා නිදහස් කිරීමේ) නියෝගවල " අ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් මෝටර් වාහන පනතේ විධිවිධානවලින් හා නියෝගවලින් ඔහු නිදහස් වන්නේ ය.

දිස්ත්‍රික් ලේකම්වරයාගේ බලතල, කාර්යය හා කර්තව්‍ය සම්බන්ධතා නිලධරයකු විසින් ක්‍රියාත්මක කිරීම හෝ කිරීම කළ හැකි බව

40. (1)ජනාධිපතිවරයා විසින්, ආඥාවක් මගින්, ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා සම්බන්ධතා නිලධරයකු ලෙස යම් තැනැත්තකු නමින් හෝ ධුරයෙන් පත් කළ හැකි ය.

(2) ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා සම්බන්ධතා නිලධරයකු ජනාධිපතිවරයා විසින් ආඥාවක් මගින් පත් කළ විට ඒ නිලධරයා විසින් ලිඛිත නීතියක් යටතේ හෝ අන් ලෙසකින් හෝ දිසාපති වෙත පැවරුණු හෝ පැනවුණු සියලු බලතල, කාර්යය හෝ කර්තව්‍ය ඒ ප්‍රදේශය තුළ ක්‍රියාවේ යෙදවිය යුතු ය; කළ යුතු ය; නැතහොත් ඉටු කළ යුතුය. තව ද ඒ කාර්යය සඳහා ඒ ලිඛිත නීතියෙහි දිසාපතිවරයා ගැන වූ සෑම සඳහන් කිරීමක් ම ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ දී ඒ සම්බන්ධතා නිලධරයා සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙස තේරුම් ගත යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් ආඥාවක් මගින්, ආඥාවේ සඳහන් යම් ප්‍රදේශ කිසිවක් සඳහා (1) වන ඡේදය යටතේ පත් කරන ලද සම්බන්ධතා නිලධරයන් විෂයෙහි අධීක්ෂණ කටයුතු කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධතා නිලධරයකු ලෙස යම් තැනැත්තකු නමින් හෝ ධුරයෙන් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝගය යටතේ සිය කාර්යය ඉෂ්ට කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධතා නිලධරයාට සහාය වීම පිණිස අවශ්‍ය , යම් නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධතා නිලධරයන් නමින් හෝ ධුරයෙන් ජනාධිපතිවරයා විසින් පත් කළ හැකි ය.

(5) මේ නියෝගය මගින් හෝ මේ නියෝගය යටතේ හෝ ප්‍රධාන සම්බන්ධතා නිලධරයා වෙත පැවරුණු හෝ පැනවුණු හෝ වෙන්කර දෙනු ලැබූ බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ප්‍රධාන සම්බන්ධතා නිලධරයා විසින් (4) වන ඡේදය යටතේ පත් කරන ලද යම් නියෝජ්‍ය නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(6) (3) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් ප්‍රධාන සම්බන්ධතා නිලධරයකු විසින් හෝ (4) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ නියෝජ්‍ය සම්බන්ධතා නිලධරයකුගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් (5) වන ඡේදය යටතේ පවරනු ලැබ සිටින්නා වූ, යම් නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධතා නිලධරයකු විසින් හෝ -

(අ) තමා අධීක්ෂණය කටයුතු කරන්නේ නම් සම්බන්ධතා නිලධරයකු විෂයෙහි ද ඒ සම්බන්ධතා නිලධරයා වෙත පවරන ලද නැතහොත් පනවන ලද බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාවේ යෙදවීම කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය ; තව ද,

(ආ) තමා අධීක්ෂණ කටයුතු කරන්නේ නම් සම්බන්ධතා නිලධරයකු විෂයෙහිලා ඒ සම්බන්ධතා නිලධරයා වෙත පනවන ලද නැතහොත් පවරන ලද බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාවේ යෙදවීම ඉෂ්ට කිරීම හෝ කිරීම පිළිබඳව, ඒ සම්බන්ධතා නිලධරයා වෙත විශේෂ හෝ සාමාන්‍ය විධාන කරනු ලැබිය හැකි ය.

රාජ්‍ය සේවකයන් යනාදීන්ගේ වගකීම.

41. මෙම නියෝගයන්හි විධිවිධාන අපක්ෂපාතීව සහ පරිපූර්ණව බලාත්මක කිරීමට සහ ඔවුනට හැකි උපරිමයෙන් මෙහි අන්තර්ගත යම් නියෝගයන් උල්ලංඝනය කිරීම වැළැක්වීම සඳහා සද්භාවයෙන් පියවර ගනු ලැබීම සියලු රාජ්‍ය නිලධරයන්, පොලිස් නිලධරයන්, සන්නද්ධ හමුදා සාමාජිකයන් සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවා නියුක්තිකයන් සහ බලධරයන්ගේ වගකීම විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.